ශීර්ෂය 122 - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 122 - සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූනි 26 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ , මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් රාජ්‍ය ආයතන 5 ක් වෙත (මෙම අමාත්‍යාංශයද ඇතුළත්ව) ලබාදි ඇති ප්‍රතිපාදනය රු.මිලියන 10,455.66 වන අතර ඉදිරිපත් වූ තොරතුරු අනුව එදිනට දරන ලද වියදම රු.මිලියන 9,357 ක් වී තිබුණි. ඉඩම් අමාත්‍යාංශය මුදල් රෙගුලාසි අංක 208 ප්‍රකාරව රජයේ ප්‍රතිපාදන වෙන්කර අදාල ආයතන වෙත බෙදා හැරිම පමණක් සිදුකර ඇතත්, මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 448,449 සහ 145 හි සඳහන් පරිදි එම ප්‍රතිපාදන ලබාගෙන වැයකළ යුතු හා වගකීම පැවරෙන ආකාරයට ක්‍රියාකර නොතිබුණි. 2024 වර්ෂය සඳහා ලබාදී තිබු රු.මිලියන 1,000 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 619.5 වැයකර ඇතත් එම වියදම තහවුරුකර ගැනීමට අදාළ තොරතුරු පවත්වාගෙන යාමට හෝ විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	අදාළ ආයතන විසින් ඉදිරිපත් කර ඇති අනුමත කරන ලද වියදම් ඇස්තමේන්තු පාදක කර ගනිමින් අදාළ ප්‍රතිපාදන නිදහස් කර ඇති බව කාරුණිකව දන්වා සිටින අතර, ප්‍රතිපාදන වෙන් කිරීමේදී අනුමත කරන ලද වියදම් ඇස්තමේන්තු වලට අනුව සිදු කර ඇත. කෙසේ නමුත්,එම ප්‍රතිපාදන වියදම් කරනු ලබන ආයතන වල ඊට අදාළ වවුචර හා බිල්පත් පවතින බැවින්, වියදම් වාර්තා අදාළ ආයතන වෙතින් ලබාගත හැකි බව දන්වා සිටින අතර, ඒ සඳහා අභ්‍යන්තර විගණනය එම ආයතනයන්හි අභ්‍යන්තර විගණන අංශයන් මඟින් සිදු වී ඇතැයි අපේක්ෂා කරන බව සඳහන් කළ හැකිය.	අභ්‍යන්තර පාලන ක්‍රමවේදයකට අනුව එම වියදම් දැරීම අධීක්ෂණය කළ යුතුය.
(ආ)	අමාත්‍යාංශය විසින් පුනරාවර්තන, ප්‍රාග්ධන වියදම්, අමාත්‍යවරයාගේ වියදම්, බිම්සවිය වැඩසටහනට අදාල වියදම් හා ඉඩම් අත්පත් කර ගැනිමේ වියදම් නිවැරදිව පුරෝකතනයක් කර හඳුනාගෙන නොතිබුණි. 2024 වර්ෂයට අදාළ වාර්ෂික කාර්ය සාධන වාර්තාවෙහි පුනරාවර්තන, ප්‍රාග්ධන හා බිම්සවිය, ඉඩම් අත්කර ගැනීම් වෙනුවෙන් පිළිවෙලින් රු.මිලියන 567 ක් ,රු.මිලියන 15 ක්,රු.මිලියන 1000 ක් හා රු.මිලියන 9,000 ක ප්‍රතිපාදන වෙන් වී ඉන් ඉතිරි වී ඇති ප්‍රතිපාදනය පිළිවෙලින් රු.මිලියන 50.77ක් ,රු.මිලියන 2.23 ක්,රු.මිලියන 380.44 ක් හා රු.මිලියන 6,320 ක් විය.	ඇස්තමේන්තු සැකසීමේදී නිවැරදිව පුරෝකථනය සිදුකර ඇතත් වර්ෂය තුල කටයුතු කිරීමේදී ප්‍රායෝගිකව සිදුවන වෙනස්වීම් ප්‍රතිපාදනවල ඉතිරිවීමට බලපා ඇත.	අවශ්‍යතාවය මත පදනම්ව ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.
(ඇ)	වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් සංවර්ධන ව්‍යාපෘති සඳහා රු.මිලියන 1,857 ක ප්‍රතිපාදන වෙන් කර රු.මිලියන 253 ක වියදමක් දරා තිබීමෙන් සංචාරක අංශය සියයට 14 ක පමණ අවම කාර්ය සාධන මට්ටමක් ලබා කර ගෙන තිබුණි.	ව්‍යාපෘති සැලසුම් කිරීමට කල්ගතවීම, ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදුවූ ගැටලුකාරී තත්ත්වය, ව්‍යාපෘති සංශෝධනය වීම, ප්‍රසම්පාදන සඳහා කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් නොවීම, අයහපත් කාලගුණික තත්ත්වයන් හා වර්ෂය තුළ මැතිවරණ ක්‍රියාත්මක වීම	ප්‍රමුඛතාවය අනුව ව්‍යාපෘති හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙළ කර ප්‍රතිපාදන ඉල්ලුම් කළ

	නිසා සියයට 14 කාර්ය සාධන මට්ටමක් පමණක් ළඟා කර ගැනීමට හේතු වූ කාරණා ලෙස හැඳින්විය හැක.	යුතුය.

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
අමාත්‍යාංශයේ 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති වැඩසටහන 2 යටතේ එළඹි රු.මිලියන 38.4 ක බැරකම් හි වවුචර්පත් ඉදිරිපත් නොවීම මත එහි නිවැරදිතාවය තහවුරුකර ගැනීමට නොහැකිවිය.	මෙම බැරකම් බිම් සවිය වැඩසටහන යටතේ අදාළ දෙපාර්තමේන්තු විසින් මාර්ගගතව CIGAS වැඩසටහනට ඇතුළත් කරන ලද බැරකම් වන බැවින් එම ගනුදෙනුවලට අදාළ වවුචර්පත් අමාත්‍යාංශය සතුව නොමැති අතර, අදාළ බැරකම්වලට එළඹි ආයතන සතුව එම වවුචර් පවතින බව කාරුණිකව දන්වමි.	බැරකම් නිවැරදිව තහවුරු කරගැනීමට හැකිවන පරිදි තොරතුරු ඉදිරිපත් කළ යුතුය.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම.

3.3 **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

	නිරීක්ෂණය			**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
(i)	මු.රෙ.103(1) ආ,එ හා 104(4)	475,000	i 2022 අප්‍රේල් 19 දින අංක PD – 2791 දරන කැබ් රථ අනතුර සම්බන්ධයෙන් පොලීසියට හා අදාළ රක්ෂණ සමාගමට වාර්තා කර නොතිබුණි.එම අනතුර සම්බන්ධයෙන් වූ අවසන් පරීක්ෂණ වාර්තාවට අනුව එම අලාභය රථය අනුයුක්ත කර තිබුණු නිලධාරියාගෙන් අයකර ගැනීමට නිර්දේශ කර තිබියදි රු.475,000 ක් වූ වියදම අමාත්‍යාංශය වැයකර අලුත්වැඩියා කර ඇතත් එම අලාභය 2025	මු.රෙ.104(4) ප්‍රකාරව රථයට සිදු වූ අලාභය, රථය අනුයුක්ත කර තිබූ නිලධාරියාගෙන් අයකර ගැනීම සඳහා අවස්ථා ගණනාවදී ලිපි මගින් දැනුවත් කිරීම් සිදු කළ ද යහපත් ප්‍රතිචාරයක් නොදක්වන හෙයින් ඉදිරි නීතිමය කටයුතු සිදු කිරීම සඳහා අදාළ කරුණු ගරු නීතිපති වෙත වාර්තා කර ඇත.	අදාළ අලාභය අයකර ගත යුතුය.

			මාර්තු 21 දින වන විටත් අදාළ නිලධාරියා ගෙන් අයකරගෙන නොතිබුණි.		
			ii මු.රෙ.104(1) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතුව නිශ්චිත වශයෙන් දැන ගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා ප්‍රාරම්භක පරීක්ෂණයක් වහාම ආරම්භ කළ යුතු වුවත් 2024 මාර්තු 30 දින අංක PH - 0668 වාහනයේ අනතුර සම්බන්ධ ප්‍රාරම්භක පරීක්ෂණ කමිටුව පත්කිරීම 2024 ජූනි 13 දින සිදු කර තිබුණි.තවද අනතුරට සම්බන්ධ රියදුරුගේ සේවය කිසිදු නිර්දේශයකින් තොරව අවසන්කර තිබුණි. මු.රෙ.104(4) ප්‍රකාරව පාඩුවක් හෝ අලාභ හානියක් සිදු වූ දිනයේ සිට මාස තුනක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් විගණිත දිනය වූ 2025 අප්‍රේල් 10 දින වන විටද පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි. තවද මේ පිළිබඳව මු.රෙ.103 ප්‍රකාරව අලාභය හානි පිළිබඳ ලේඛනයේ සටහන් කර නොතිබුණි.	වාහන අනතුර පිළිබඳව මු.රෙ.104 ප්‍රකාරව පරීක්ෂණය සිදුකර 2024.07.22 දින වාර්තාව ලබාදී තිබුණි. කෙසේ වෙතත් මෙම වාහන අනතුර සම්බන්ධව නීතිමය පියවර ඉදිරියට ගන්නා බව කුරුණෑගල වැහැර පොලිස් ස්ථානාධිපති විසින් 2024.04.18 දින අමාත්‍යාංශය වෙත දන්වා ඇත. අදාල රියදුරා මේ සම්බන්ධව වගකිවයුත්තේ නම් ඒ පිළිබඳව අධිකරණ ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස වැහැර පොලිස් ස්ථානාධිපති වෙත 2024.12.30 දින ලිඛිතව දන්වා ඇති බවද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. අදාල වාහනයට සිදු වී ඇති හානිය අදාල වාහනයේ එම නියෝජිත ආයතනය වන United Motors ආයතනය මගින් 2024.05.17 දින ලිඛිතව දන්වා ඇති අතර එය රු.මිලියන 2.9 ක් ලෙස වාර්තා කර ඇත.	මු.රෙ. ප්‍රකාරව කටයුතු කර අදාල අලාභය අයකර ගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්ති	251,476	සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 02 දෙනෙකුගෙන් අයවිය යුතු රු.251,476 ක ණය ශේෂය ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි අවස්ථාවලදී අනුගමනය කළ යුතු යැයි නියම කොට	කේ. මනුවෙල් මහතා 2021.02.25 දින සිට අකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගන්වා ඇති අතර ඔහුගෙන් අයවිය යුතු රු.මිලියන 0.16 ක ණය ශේෂය විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර ගැනීමට දන්වා යවා ඇත.	ණය ශේෂය අයකර ගත යුතුය.

		ඇති ක්‍රියාමාර්ග ඇපකරු සම්බන්ධයෙන් ගත යුතු අතර ප්‍රධාන ණයකරු මියගොස් ඇත්නම් සහ ඔහුගේ උරුමක්කාරයන්ගෙන්ද අයකර නොගත් වර්ෂ 01 – 03 ත් අතර පැරණි ණය ශේෂයන් පවතින බව නිරීක්ෂණය විය.	එනමුත් ඔහු වෙත විශ්‍රාම වැටුප හිමිවන්නේ වයස අවුරුදු 55 සම්පූර්ණ කරන 2029 වර්ෂයේදී බැවින් අයදුම්පත පසුව ඉදිරිපත් කරන ලෙස දන්වා ගොනුව ආපසු එවා ඇත. ඔහුට හිමි වැටුප් සංශෝධනය මත ගෙවිය යුතුව තිබූ හිඟ වැටුපෙන් රු.මිලියන 0.081 ක ආපදා ණය ශේෂයක් හිලව් කර කර ඇත.ඉතිරි ණය ශේෂය පියවන ලෙස දන්වා 2025.01.03 හා 2025.03.25 දිනැති ලිපි මගින් අදාල ණයගැතියා දැනුවත් කර ඇත.සී.එස්.වයි.එම්.ජී.එම්. ජයසේකර මියගේ අදාල ඇපකරුගෙන් රු.මිලියන 0.091 ක අදාල ණය ශේෂය මාසිකව වාරික වශයෙන් අයවෙමින් පවති.

3.4 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා වෙත රජයේ නිල නිවාසය රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය මහින් 2022 අගෝස්තු 23 දින ගිවිසුම් පත්‍රයක් මගින් ලබාදී තිබුණු අතර එම ගිවිසුම් පත්‍රයේ 07 වන වගන්තිය ප්‍රකාරව නිවසට අදාළ විදුලිය ජලය හා දුරකථන සේවා සැපයීම වෙනුවෙන් වූ බිල්පත් අමාත්‍යවරයාගේ පෞද්ගලික වියදමින් ගෙවීම් කළයුතු වුවත් නිල නිවසට අදාළ ජල හා විදුලිය බිල්පත් වෙනුවෙන් 2024 වර්ෂය තුළ රු.මිලියන 1.06 ක මුදලක් ඉඩම් අමාත්‍යාංශය දරා තිබුණි. 1996 සැප්තැම්බර් 25 දිනැති අංක අමප/96/1985/106/136 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව ගරු අමාත්‍යවරුන්ගේ හා ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ ජල හා විදුලි බිල්පත් ගෙවීම වෙනුවෙන් මාසිකව රු.මිලියන	එම නිවසට අදාළ විදුලිය, ජලය හා දුරකථන සේවා සැපයීම වෙනුවෙන් බිල්පත් නිරවුල් කිරීම 1996 සැප්තැම්බර් මස 18 දින ගරු අමාත්‍යවරුන්ගේ සහ ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ ජල හා විදුලි බිල් පත් ගෙවීම මැයෙන් නිකුත් කරන ලද අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සිදුකර ඇත. එසේම ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ගරු අමාත්‍යතුමාගේ වැටුපෙන් ජලය හා විදුලිය බිල්පත් සඳහා රු.මිලියන 0.001 ක මුදලක් මාසිකව අයකර රජයේ ආදයමට බැර කර ඇත.	රජයේ වියදම් පාලනය කෙරෙහි අවධානය යොමුකර ඒ අනුව කටයුතු කළ යුතුය.

	0.001 ක මුදලක් 1996/09/01 දින සිට ඔවුන්ගේ වැටපෙන් අයකිරීමට තීරණය වී තිබුණි. ඒ අනුව රු.මිලියන 1.06 ක මුදලක් අමාත්‍යාංශය වැය කරන විට අමාත්‍යවරයාගේ වැටුපෙන් මාස 10 ක කාලයක් සඳහා රු.මිලියන 0.01 ක් පමණක් අය කර තිබුණි.		
(ආ)	2024 වර්ෂයේ පැවැත් වූ ලෝක ඉඩම් සමුළුව සඳහා සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ එවකට සිටි ලේකම්වරයා,ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් ජනරාල් හා ඉඩම් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ඉඩම් ප්‍රතිපත්ති යන නිලධාරින් තිදෙනා සහභාගි වූ අතර එම සමුළුව සඳහා ගමන් වියදම්, ලියාපදිංචි ගාස්තු, ගුවන් ටිකට්පත් ගාස්තු, ගමනා ගමන පහසුකම්, නවාතැන් පහසුකම් හා ආහාර පාන ලබාදෙන බවට ලෝක බැංකුවේ ශ්‍රී ලංකා හා මාලදිවයින් කළමනාකරුගේ 2024 මාර්තු 13 දිනැති ලිපියෙහි සඳහන් වී තිබුණි. එමෙන්ම භාණ්ඩාගාර ලේකම්වරයා විසින් 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6 වන ඡේදයේ සඳහන් පරිදි විදේශීය අනුග්‍රාහක ආයතනය විසින් පූර්ණ පිරිවැය දරන්නේ නම් මිස විදේශීය අධ්‍යයන/පුහුණු/සම්මන්ත්‍රණ සඳහා නිලධාරීන් සහභාගී නොකළ යුතුය යන්න සඳහන්ව තිබුණු අතර,මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 01/2015/01 හා 2015 මැයි 15 දිනැති චක්‍රලේඛයේ 04(අ) වගන්තිය ප්‍රකාරව නවාතැන් හා ආහාර පාන සඳහා වූ වියදම් විදේශ රජය හෝ ප්‍රදාන ආයතනය විසින් නොදරනු ලබන විටදී පමණක් සංයුක්ත දිමනා ලබාගත හැකි වුවත්, නිලධාරීන් දෙදෙනා වෙත සංයුක්ත දීමනාව ලෙස රු. මිලියන 0.715 ක් ගෙවා තිබුණි.	2024 වර්ෂයේ පැවැත්වූ ලෝක ඉඩම් සමුළුව සඳහා අදාල සියළුම වියදම් දරන බව ලෝක බැංකුවේ ශ්‍රී ලංකා මාලදිවයින් කළමනාකරුගේ 2024.03.13 දිනැති ලිපිය දන්වා ඇත. ඒ අනුව, දිවයිනෙන් බැහැර ගත කිරීමට අනුමැතිය සහ නිලධාරින් සඳහා අනියම් දීමනාව, සංග්‍රහ දීමනාව සහ උණුසුම් ඇඳුම් දීමනාව ශ්‍රී ලංකා රජයේ වියදමින් ගෙවීම සඳහා ජනාධිපති ලේකම්ගේ අනුමැතිය ඉල්ලුම් කර ඇත. සංචාරයට අදාල අනෙකුත් දීමනා ශ්‍රී ලංකා රජයෙන් දැරිය හැකි බව ජනාධිපති ලේකම් දන්වා ඒ අනුව, අනියම් දීමනාව සහ උණුසුම් ඇඳුම් දීමනාව ගෙවීම් කර ඇත. නමුත් ලෝක බැංකුව මඟින් නවාතැන් පහසුකම් ලබා දී තිබුණද එයට ආහාරපාන අඩංගු නොවන බව එවකට සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ ලේකම් 2024.04.29 දිනැති ලිපියක් මඟින් දැනුම් දී ඇති අතර අදාල සංයුක්ත දීමනාව ඉල්ලා ඇත. අදාල ඉල්ලීම හා ජනාධිපති ලේකම්ගේ 2024.04.05 දිනැති ලිපිය අනුව සංයුක්ත දීමනා ගෙවීමට කටයුතු කර ඇති බව කාරුණිකව දන්වමි.	චක්‍රලේඛයේ උපදෙස් ප්‍රකාරව නියමිත දීමනාව පමණක් ගෙවීම් කළ යුතුය.
(ඇ)	බිම්සවිය වැඩසටහන ක්‍රියාත්මක නොවන ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙත අමාත්‍යාංශය ප්‍රතිපාදනයෙන් රු. මිලියන 50 ක් බිම්සවිය වැඩසටහන සඳහා 2024 වර්ෂයේදි වෙන්කර ඇතත් ඉන් රු.මිලියන 0.92 ක් පමණක් වියදම් කර රු.මිලියන 48.6 ක් ඉතිරිවී තිබුණි. වැයකර ඇති මුදල බිම්සවිය වැඩසටහන සඳහා වැයකර නොමැති බව විගණනයේදි නිරීක්ෂණය විය	උරුමය වැඩසටහන යටතේ සින්නක්කර ඔප්පු වැඩසටහන සඳහා ප්‍රතිපාදන ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු බැවින් පෙර වර්ෂයේ දී මෙන් බිම්සවිය වැඩසටහන යටතේ දිමනාපත් නිකුත් කිරීම සඳහා එම ප්‍රතිපාදන වියදම් වී නොමැති බව දන්වා ඇත.තවද, 2024 සැප්තැම්බර් මාසයේ දී බිම්සවිය යටතේ	ප්‍රතිපාදනයන් අනුමත වියදම් සඳහා පමණක් දැරීමට වගබලා ගත යුතුය.

.		වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් රු.100,000 ක් පමණක් රඳවාගෙන ඉතිරි ප්‍රතිපාදන පවරා ගන්නා ලෙස අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති බැවින් ඒ වනවිට දරා ඇති වියදම් සියල්ලම සඳහා ප්‍රතිපාදන නිදහස් කරන මුල් අවස්ථාවේදී ඉදිරිපත් කරන ලද වියදම් ඇස්තමේන්තුවට යටත්ව වියදම් කර ඇති බව කාරුණිකව දන්වමි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිලියෙල කිරීමේදී හා එය ක්‍රියාත්මක කිරීමේදී සකස් කල ඉලක්ක හා ප්‍රගතිය, වාර්තාවෙහි සඳහන්වන පරිදි අමාත්‍යාංශයේ වැඩ කොටස් පාලන අංශය,ඉඩම් සංවර්ධන අංශය,අත්පත් අංශය, ප්‍රතිපත්ති අංශය,ව්‍යාපෘති අංශය සහ සැලසුම් අංශය ලෙස අංශයන් බෙදා තිබුණද එක් එක් අංශය මඟින් ඉදිරි වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට සකස් කල අංශික සැලසුම් හා කාර්යයන් අයවැය ඇස්තමේන්තු සඳහා යෝජනා ඇතුළත් ලිපිගොනුවෙහි නොතිබුණි.	එළඹෙන වර්ෂයේ සිට ආංශික සැලසුම් හා කාර්යයන් අයවැය ඇස්තමේන්තු සඳහා යෝජනා ඇතුළත් ගොනුවට, ඇතුළත් කිරීමට පියවර ගෙන ඇත.	එක් එක් අංශයන් වෙනුවෙන් වෙන් වෙන්ව ක්‍රියාකාරී සැලැස්ම සහ ප්‍රගතිය සඳහන් කළ යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට කාබනික පොහොර ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 350 ක් අමාත්‍යාංශය ප්‍රතිපාදන ලබාදී ඇතත් එම ව්‍යාපෘතිය ශක්‍යතා අධ්‍යනයකින් සහ නිසි අධීක්ෂණයකින් තොරව ක්‍රියාත්මක වී, සම්පූර්ණයෙන්ම නතර වී ඇත. එහි සිදුවී ඇති අක්‍රමිකතාවයන් සෙවීම සඳහා වර්තමානයේ විශේෂ විමර්ශන කමිටුවක් පත්කර ඇතත් එම කමිටු වාර්තාව මේ දක්වා නිමකර නොතිබුණි.එම ව්‍යාපෘතිය 2021 දෙසැම්බර් මාසයෙන් පසුව ඉඩම් අමාත්‍යාංශය වෙත පවරා ඉතිරි මුදල වූ රු.මිලියන 1.86 ක් අමාත්‍යාංශයේ ගිණුමට	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනාව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියෙන් කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත.එම ව්‍යාපෘතිය උතුරු මැද පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ක්‍රියාත්මක කරන ලද කාබනික පොහොර නියමු ව්‍යාපෘතිය අවසන් කොට සම්පත් බැහැර කිරීම පිළිබඳව 2023.03.28 දිනැති අංක අමප/23/0383/615/017 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව විශේෂ විමර්ශන කමිටුවක් පත් කර ඇත. එම කමිටුවේ සභාපති කම්කරු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා වන අතර ඔහු එම	කාබනික පොහොර ව්‍යාපෘතිය විශේෂ විමර්ශන කමිටු වාර්තාව නොපමාව ලබාගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.

	ලැබී පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණි.කෙසේ නමුත් මෙම මුදලින් නැවත කොමිෂන් සභාව විසින් EPF, ETF සහ කාබනික පොහොර මධ්‍යස්ථාන වල විදුලි බිල්පත් ගෙවීම් කිරීම වෙනුවෙන් ඉල්ලුම් කල රු.මිලියන 1.65 ක් නැවත කොමිෂන් සභාවට ලබාදී තිබුණි.	අමාත්‍යාංශයේ ලේකම්ධූරයට පත් වීමත් සමඟ විශේෂ විමර්ශන කමිටුවෙන් ඉවත් වී පසුව එම කමිටුවේ සභාපති ලෙස පත් වූ කෘෂිකර්ම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා විසින් මේ වන විට එම වාර්තාව සකස් කරමින් පවතී. ව්‍යාපෘතිය අවසන් කිරීමෙන් පසු 2024.06.18 දින කොමිෂන් සභාවේ කාබනික පොහොර ව්‍යාපෘතිය නමින් අනුරාධපුර ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන ගිය ජංගම ගිණුම වසා ඉතිරි මුදල අමාත්‍යාංශයේ ජංගම ගිණුම වෙත මාරු කර ඇත. EPF හා ETF ගෙවීම සේවා යෝජක ආයතනයේ ව්‍යවස්ථාපිත වගකීමකි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විධිමත් අනුමැතිය සහිත තනතුරු වල සේවා නියුක්ත කරන ලද සේවකයින්ට කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය මඟින් විධිමත් පරිදි වැටුප් ගෙවා ඇති බැවින් සහ එම වැටුප් මත සේවායෝජකයා විසින් ගෙවිය යුතු EPF හා ETF දායක මුදල් ගෙවීම් කර නොතිබුණි. එම ගෙවීම සිදු කිරීමට කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීමකට අනුව එම මුදල නිදහස් කරන ලදී .ලංකා විදුලි බලමණ්ඩලයට ගෙවිය යුතු බිල්පත නිරවුල් කර නොතිබුණ බව කොමිෂන් සභාව විසින් දැනුම් දී අදාල මුදල් ගෙවීම් කරන ලදී.	
(ආ)	බිම්සවිය වැඩසටහන 1998 වර්ෂයේදී නියාමන වැඩසටහනක් ලෙස ආරම්භ වි වර්තමානය වනවිට වසර 26 ක් ගතවි දරා ඇති වියදම රු.මිලියන 9,357 ක් විය. හිමිකම් සහතික ලබාදි ඇති සංඛ්‍යාව 462,922 ක් වන අතර ගැටලුකාරි ලෙස පැවති ඉඩම් කැබලි වලට අදාළව පසෙක තබා ඇති ලිපිගොනු සංඛ්‍යාව 500,739 ක් විය. දිවයිනපුරා ඉඩම් කැබලි මිලියන 16 ක් ඇස්තමේන්තුගත කර ඇති අතර ඉන් මිලියන 2.1 ක් මැන අවසන් කර ඇතත් තව මිලියන 13.9 ක් මැනිමට ඉතිරිව පැවතීමත් අනෙක් සංඛ්‍යාලේඛණ අනුව නිරීක්ෂණය වූ අතර වැඩසටහන කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අභ්‍යන්තර වැඩපිළිවෙලක් අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි.	බිම්සවිය වැඩසටහන සාර්ථකව සිදු කිරීම සඳහා ව්‍යාපෘති අංශය කිසිඳු වැඩ පිළිවෙළක් සකස් කර නොතිබුණු බවට වන නිරීක්ෂණය පිළිබඳ එකඟ නොවෙමි. 1998 වර්ෂයේ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ වී මේ දක්වා වසර 27 ක් ක්‍රියාත්මකව ඇත. මුල් අදියර වලදී ඒ සඳහා වෙනම අංශයක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වී පැවැති අතර, 2020 වර්ෂයේදී ව්‍යාපෘති අංශය ආරම්භ වීමෙන් පසුව මෙම වැඩසටහන ද අධීක්ෂණය කිරීමේ වගකීම ව්‍යාපෘති අංශයට පවරා තිබුණි.එම අංශයෙන් වැඩසටහන සමායෝජන කටයුතු, ප්‍රගති සමාලෝචනය සහ ගැටලු නිරාකරණය ඉටු කරනු ලබයි. සැම මසකම බිම්සවිය සමායෝජක කමිටු පවත්වනු ලබන අතර,එහිදී භෞතික හා මූල්‍යාය ප්‍රගතිය අධීක්ෂණය කරනු ලබන අතර, ආයතන අතර පවතින ගැටළු ද ක්ෂේත්‍රයේ දී ඉදිරිපත් වන සංකීර්ණ ගැටළු ද සාකච්ඡා කර විසඳුම් ලබා දීමට ක්‍රියාකරනු ලබයි.	මෙම වැඩසටහන සඳහා සෑම මාසයකම අධීක්ෂණ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය.

(ඇ)	අමාත්‍යාංශය වාර්ෂික කාර්ය සාධන වාර්තාව අනුව අමාත්‍යාංශය යටතේ දෙපාර්තමේන්තු, ආයතන, සභාවන් සහ මණ්ඩල වශයෙන් ආයතන 8 ක පරිපාලන කටයුතු භාරව පැවතියද ඒවායේ සමස්ථ කාර්යසාධනය ඉතාමත් අඩු මට්ටමක පැවතීම රටේ සංවර්ධන අවශ්‍යතාවයට ඉඩම් අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ අනෙකුත් ආයතන කඩිනම් තීරණ ගැනීමට බාධාවන් ලෙස පවති. පනත් හා නීතීන් 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද කාර්යයන් 12 ක් පිළිබඳව එම වාර්තාවෙහි සඳහන් වුවද 2024.12.31 දින වනවිට එයින් කාර්යයන් 11 කට අදාළව කාර්යභාරය අවසන් වී නොමැති තත්ත්වයක් විගණනයේදී නිරීක්ෂණය විය.	අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු, ආයතන, සභාවන් සහ මණ්ඩල විසින් එම ආයතනයන්ට අදාළ අණ පනත් සංශෝධන අවශ්‍යතා හඳුනාගැනීම, චක්‍රලේඛ නිකුත් කිරීම සිදු කරනු ලබයි. මෙම අංශය විසින් සිදු කරනු ලබන්නේ අදාළ අණ පනත් සංශෝධන ක්‍රියාවලියේදී නීති කෙටුම්පත් සම්පාදක, නීතිපති,අමාත්‍ය මණ්ඩලය සහ පාර්ලිමේන්තුව වෙත අදාළ කෙටුම්පත් යොමු කිරීම මේ දක්වා අප්‍රමාදීව සිදු කර ඇත.	අනපනත් සංශෝධනය කඩිනමින් සිදුකර ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

4.3 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දිස්ත්‍රික් ලේකම් කාර්යාල 7 ක ව්‍යාපෘති 12 කට ලබාදුන් රු.මිලියන 228.96 ක ප්‍රතිපාදන එම ව්‍යාපෘති ආරම්භ නොකිරීම මත 2024 දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශය එම මුදල් නැවත පවරා ගෙන තිබුණි.	දිස්ත්‍රික් ලේකම් කාර්යාල 7 ක ව්‍යාපෘති 12 කට ලබාදුන් රු.මිලියන 228.96 ක ප්‍රතිපාදන, 2024 දෙසැම්බර් 31 වන විට අමාත්‍යාංශයට නැවත පවරා ගැනීමට සිදු විය.	නිසි අධ්‍යයනයක් මත සැළසුම් සකස්කර ව්‍යාපෘති ආරම්භ කිරීමට ප්‍රතිපාදන නිකුත් කළ යුතුය.
(ආ)	ඇස්තමේන්තුගත වියදම රු.මිලියන 100 ක් වූ ලන්දේසි කොටුව අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 2.78 ක් වියදම් දරා තිබූ අතර එය සියයට 2 ක් වූ ඉතා අවම කාර්යසාධන මට්ටමක් ලගාකර ගෙන තිබුණි.	ඉදිකිරීම් ආරම්භ කල වහලය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව නිර්දේශිත මෛක්‍රෝ ඉරු දැව යොදා එහි ඉදිකිරීම් අවසන් වන තුරු ගොඩනැගිල්ලේ අභ්‍යන්තර ඉදිකිරීම් සිදුකිරීමේ හැකියාවක් නොමැත. මෙම මෛක්‍රෝ ඉරු දැව රාජ්‍ය දැව සංස්ථාවෙන් ඇනවුම් කලද එම මෛක්‍රෝ කඳන් නොමැති වීම නිසා මෙතෙක් එම දැව ලැබී නොමැත. 2024 වර්ෂයේ කල්පිටිය සංචාරක කලාපය සඳහා ප්‍රධාන සංචාරක සැලැස්මක් වයඹ පළාත් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සකස් කරමින් පැවතීම හා එම සැලැස්මට කල්පිටිය බලකොටුවද ඇතුළත් බැවින් මෙම බලකොටුවේ සංවර්ධන ව්‍යාපෘතිය එම සැලැස්මට අනුකූලව සිදුකිරීම සඳහා එම ප්‍රධාන සැලැස්ම අවසන් වන තුරු 2024 වර්ෂයේ එම ව්‍යාපෘතිය ආරම්භ කිරීම සිදු නොකරන ලදි.	ප්‍රතිපාදන වෙන්කිරීමට පෙර ව්‍යාපෘති සැලසුම් සහ මුලික අවශ්‍යතා පිළිබඳ සොයා බැලිය යුතුය.

(ඈ)	අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන උද්භිද උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 55 ක ප්‍රතිපාදනයක් ලැබී ඇතත් එහි කිසිදු කාර්ය සාධනයක් අත්කර ගෙන නොතිබුණි.	මෙම ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇතත්, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය හා අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අනුව, මෙම ප්‍රසම්පාදනය පිරිනැමීම සඳහා සුදුසුකම් ලත් සැපයුම්කරුවෙක් නොමැති බව දන්වා තිබුණි. නැවත 2024 වර්ෂය තුළ ප්‍රසම්පාදන කැඳවීමක් සිදු කිරීමට මාස 02 ක කාලයක් ගත වන බැවින් එම වර්ෂය තුළ මෙම ප්‍රසම්පාදන කටයුතු අවසන් කිරීම අපහසු බව නිරීක්ෂණය කරන ලදී.	සැලසුමකින් යුතුව ප්‍රතිපාදන වෙන් කරගත යුතුය.
(ඇ)	කිතුල්ගල සංචාරක තීරය සංවර්ධනය කිරීම යටතේ වූ ව්‍යාපෘති 02 ක් වෙනුවෙන් වෙන්කල රු.මිලියන 24 ක ප්‍රතිපාදන සඳහා කිසිදු කාර්යයක් ආරම්භකර නොතිබුණි.	බැරැන්ඩි කෝවිල පරිශ්‍රයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිශ්චිත ස්ථානයක් ලබාදීමට ප්‍රමාදවීම හා පෙන්වා දුන් ස්ථානයේ විශාල ගස ඉවත් කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ අවශ්‍ය වූ බැවින් ඉදිකිරීම් ප්‍රමාද වී ඇත. මෙම ව්‍යාපෘතිය මෙම වර්ෂය තුල අවසන් කිරීමට අපහසු බැවින් ව්‍යාපෘතිය අවලංගු කිරීම වඩාත් සුදුසු බව 2024.12.09 දින ප්‍රගති සමාලෝචන රැස්වීමේදී තීරණය කල බව දන්වන ලදී.	ව්‍යාපෘති සම්බන්ධව ශක්‍යතා අධ්‍යයනයක් කර ප්‍රතිපාදන නිදහස් කර ගැනීමට වගබලා ගත යුතුය.
(ඉ)	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් සිදුකරනු ලබන ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 16.7 ක් වූ හිරිවඩුන්න පාලම අසල සිට පින්නවල අලි අනාථාගාරය දක්වා ඇවිදින මංතීරුවේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව සිදුකල යුතු වීදිපහන් සවිකිරීම මුල් සැලසුම තුල අන්තර්ගත නොවීම මත ඇස්තමේන්තු සංශෝධනය කිරීමට සහ අනුමැතීන් ලබා ගැනීමට කාලයක් ගතවීමෙන් එම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකිවී තිබුණි.	හිරිවඩුන්න පාලම අසල සිට පින්නවල අලි අනාථාගාරය දක්වා ඇවිදින මංතීරුවේ ඉතිරි කොටස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, 2025 වර්ෂයේ ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර ඇත.	නිසි සැලසුමකට අනුව ඇස්තමේන්තු සකස් කළ යුතුය.

4.4 වත්කම් කළමනාකරණය

4.4.1 වාහන පාලනය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2025 ජනවාරි 27 දිනැති MT/IAI/1/7/1 – 2024 දරණ අභ්‍යන්තර විගණන වාර්තාව අනුව සංචිත වාහනයක් වන PF 6977 දරණ කැබ් රථයෙන් රු.139,321ක් වටිනා ඉන්ධන ලීටර් 439.5 ක් අවභාවිතා කර ඇති බව හෙළිදරව් වී ඒ පිළිබඳ දින 14ක් ඇතුළත වාර්තාවක් අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලෙස 2025 ජනවාරි 30 දින T/IAI/1/7/IAQ – 2025 දරණ ලිපිය මගින් අතිරේක ලේකම් (පාලන) වෙත දන්වා තිබුණ ද, 2025 මාර්තු 05 විගණන දින වන විටත් එම වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.	PF-6977 දරන වාහනයේ ඉන්ධන හා මයිලෝ මීටරය අතර වෙනසක් පවතින බව වාර්තා වී ඒ පිළිබඳව පරීක්ෂා කොට නොපමාව වාර්තාවක් ලබා දෙන ලෙස ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත 2024.08.16 දින ලිඛිතව දන්වා ඇති නමුත් එම පරීක්ෂණයට අදාලව වාර්තාව මෙතෙක් මා වෙත ලැබී නොමැති අතර,ඒ පිළිබඳව මේ වන විට අමාත්‍යාංශයේ ලේකම් විසින් 2025.03.20 දින කමිටුවක් පත්කර විමර්ශනයක් සිදු කරමින් පවතී.	වාහන ඉන්ධන අවභාවිතා වීම පිළිබඳ පරීක්ෂණය කඩිනම් කර අලාභය අයකර ගැනීමට හා එය වැළැක්වීමට පියවර ගත යුතුය.
(ආ)	සංචාරක අමාත්‍යාංශය සතු අංක CAU – 4004 දරණ ජීප් රථය 2019 වර්ෂයේදී අනතුරකට ලක්වී එම අනතුරෙන් පසුව ශ්‍රී ලංකා සංචාරක සම්මේලනය කාර්යාංශය වෙත භාරදී 2023 නොවැම්බර් 23 දින රු.මිලියන 11.52 ක අලුත්වැඩියා වියදමක් එම කාර්යාංශය මඟින් සිදු කර වසර 05 ක කාලයක් භාවිතා කිරීම සඳහා කාර්යාංශයට පවරා දී නැවත 2024 නොවැම්බර් 25 දිනැති අංක MT/ADM/02/06/08/V දරණ ලිපිය මඟින් අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට කටයුතු කර ඇතත්, රජයේ දේපලකට සිදුවූ හානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102,104,105 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.එසේම මෙම ජීප් රථය වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 වන විට සම්මේලනය කාර්යංශය විසින් වැය කර තිබුණු රු.මිලියන 12.4 ක මුදල ප්‍රතිපූර්ණය කිරීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.	අනතුරට පත්වූ වාහනය අළුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 22.1 ක මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.අදාල රක්ෂණ ආයතනය මෙම මුළු මුදල ගෙවීමට නොහැකි බව දන්වා රු.මිලියන 9.3 ක් පමණක් ගෙවීමට එකඟ වී තිබූ අතර, රු.මිලියන 22.1 ක් වූ මුළු මුදලින්, රු.මිලියන 11.5 මුදල ගෙවීමට නොහැකි වී තිබීම මත සහ භාණ්ඩාගාරයෙන් හිඟ මුදල අමාත්‍යාංශය වෙත ලබා දෙන ලෙස ඉල්ලා සිටියද, එය නොලැබීම මත ගත යුතු ප්‍රශස්ථ තීරණයක් ලෙස ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශයේ ප්‍රවාහන අවශ්‍යතා සළකා එම හිඟ මුදල වූ රු මිලියන 11.5 ගෙවා ඇති අතර එය හේතුකොටගෙන එහි සභාපතිවරයාට වසර 05 ක කාලයක් මෙම වාහනය භාවිතා කිරීම සඳහා පමණක් අනුමැතිය ලබා දී තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර රජයට සිදුවූ හානිය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය.
(ඇ)	සංචාරක අමාත්‍යාංශය භාරයේ පවතින GH-3129 දරණ මෝටර් රථය 2023 වර්ෂයේ සිට භාවිතයෙන් ඉවත්කර තිබුණද එම රථයේ අයිතිය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සතුව පවතින බැවින් අපහරණ ක්‍රියාවලිය සිදුකිරීමට නොහැකි වී තිබුණි. මෙම මෝටර් රථය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.	GH – 3129 රථය අපහරණ ක්‍රියාවලිය සිදු කිරීම සඳහා වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් වෙත එහි ලියාපදිංචි සහතිකය ඉල්ලා ලිපියක් යවා ඇතත් එම සහතිකය මෙතෙක් ලැබී නැත.එම සහතිකය ලබා දීම තවදුරටත් ප්‍රමාද වන්නේ නම්, මෙහි නෛතික කටයුතු සිදු කිරීමට හැකියාවක් නොමැති	වත්කමේ අයිතිය පවරාගෙන අපහරණය කළ යුතුය.

		බැවින් එම අමාත්‍යාංශය වෙත වාහනය නැවත භාර දීමට කටයුතු කටයුතු කරන බව දන්වමි.තවද මෙම වාහනය සම්බන්ධයෙන් ලිපි ගොනුවක් හෝ ලොග් පොතක් මෙම අමාත්‍යාංශය මගින් පවත්වාගෙන ගොස් නොමැති බැවින් මේ සම්බන්ධයෙන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු බැව් කාරුණිකව දන්වා සිටිමි.	

4.5 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 ජනවාරි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා අමාත්‍යවරයාගේ කාර්ය මණ්ඩලය වෙත රු.මිලියන 11.14 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවීම් කර ඇතත් රාජකාරියට පැමිණීම,පිටත්වීම හා රාජකාරී ස්ථානයෙන් බැහැරයාමට පූර්ව අනුමැතිය ලබාගත් බවට අවශ්‍ය ලේඛන පවත්වා නොතිබුණු අතර ඔවුන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය වූ බවට සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් 2017 අප්‍රේල් 19 දින නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2017 පරිදි හා 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 හා 2009 ජුනි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(1) අනුව අමාත්‍ය කාර්ය මණ්ඩලය සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතය නොකිරීම හේතුවෙන් සේවයට වාර්තා කිරීම පිලිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.	අමාත්‍ය කාර්යමණ්ඩලය විසින් සිදුකරනු ලබන රාජකාරි සඳහා ගමන් වියදම් හා අතිකාල දීමනා සඳහා ගෙවීම් කිරීමට විශේෂිත රාජකාරී පැහැදිලිව දක්වා පෞද්ගලික ලේකම්ගේ නිර්දේශය සහිතව යොමු කරනු ලැබෙයි. ඒ අනුව, ලේකම්ගේ අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකරනු ලැබේ. රාජකාරි ක්ෂේත්‍ර ගමන්වලදී පූර්ව අනුමැතිය ලබා ගත යුතු බවට අප විසින් වරින් වර ලිඛිතව ද වාචිකව ද අදාළ නිලධාරීන් වෙත දැනුම් දී ඇත. නමුත් ප්‍රායෝගිකව එය සිදු නොවී ඇති බවට වන නිරීක්ෂණ හා එකඟ වෙමි. අමාත්‍ය කාර්ය මණ්ඩලයේ අනුයුක්තව සේවය කළ රියදුරන් අතිකාල හා ගමන් වියදම් වවුචර්පත් ඉදිරිපත් කිරීමේදී ඔවුන් සේවය කළ දිනයන්හි පැමිණීම පිටවීම සනාථ කර ගැනීම් සඳහා රියදුරන්ගේ දෛනික සටහන් පත්‍ර පදනම් කරගනියි. එහිදී එම වාහන භාවිතා කරන නිලධාරියා මඟින් එම ධාවන සටහන් නිර්දේශ කර ඉදිරිපත් කිරීම මඟින් එම රාජකාරිය සිදු කර ඇති බව තහවුරු කර ගනී.	අමාත්‍ය කාර්ය මණ්ඩලයට අයත් නිලධාරීන් රාජකාරියට වාර්තා කරන විට ඇඟිළි සලකුණු යන්ත්‍රය මගින් සහ පැමිණීමේ ලේඛණයේ අත්සන් යෙදීමෙන් පැමිණීම හා පිටවීම සනාථ කළ යුතුය.
(ආ)	ඉඩම් අත්පත් කර ගැනීම් ,ඒ සඳහා වන්දි හා පොළී ගෙවීම වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීම් ලිපිගොනු 17,048 ක ප්‍රමාණයෙන්,වන්දි ගෙවා අවසන් කර ඇති ලිපි ගොනු ප්‍රමාණය 156 ක් වීය.එම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා සති 149 - 173 ත් අතර කාලයක් මෙන්ම ඇතැම් අවස්ථාවන්හිදී වසර ගණනාවක් ගතවී තිබුණද ඒ සම්බන්ධ තොරතුරු පද්ධතියක් නොපැවත්වීම	ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා ගතවන කාලය අවම කිරීම හා එම ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමේ අරමුණින් අත්කර ගැනීමේ පනත සංශෝධනට හා දත්ත කළමනාකරණ පද්ධතියක් සකස් කිරීමට යෝජනා කර ඇති අතර, ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ අනුව පනත සංශෝධනය මේ වන විට අවසන් පනත් කෙටුම්පතට අදාළව නිරීක්ෂණ නිති කෙටම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. දත්ත	ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	තොරතුරු ලබා ගැනීමට ප්‍රධාන බාධාවක් බව නිරීක්ෂණය කරනු ලැබේ.පසුගිය වසර 05 ක කාලය තුළ රු.මිලියන 21,212.23 ක ප්‍රතිපාදනයෙන් රු.මිලියන 13,448.43 ක් ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් පොලි හා වන්දි ලෙස ගෙවීම් කර තිබුණි. මෙම සියලුම ගෙවීම් සඳහා මු.රෙ.208 ,448,449 සහ145 හි උපදෙස් ලබා දී තිබුණි.ඉඩම් අත්පත් කර ගැනීමේදී පවතින නීතිරීති රාමුවට අනුව රාජකාරී ඉටු කිරීමේදී දීර්ඝ ප්‍රමාදයක් සිදුවන අතර එම තත්ත්වය වර්තමානයට ගැලපෙන පරිදි වෙනස්වීම්වලට ලක් කර නොමැති බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.	කළමනාකරණ පද්ධතියට අදාළ තොරතුරු මාගේ උක්ත සමාංක හා 2025.04.10 දිනැතිව ඔබ වෙත යොමු කර ඇත.	
(ඈ)	රජයේ සංවර්ධන කටයුතු සඳහා ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳව සිදුකරන විගණනයේදි අවස්ථා 05 කට අදාළව ඇස්තමේන්තු අවස්ථාවේදී වන්දි මුදල රු.මිලියන 1,861 ක් වූ අතර අදාල වන්දි ගෙවීම් කරන අවස්ථාවේ එය රු.මිලියන7,464.03 ක් වී තිබුණි.එය අනුමත ඇස්තමේන්තුවට වඩා සියයට 116 සිට සියයට 310 ක් දක්වා වියදම ඉහළ ගොස් තිබුණි.	පනත අනුව අත්කර ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමේදී යෝජිත ඉඩමේ දළ ඇස්තමේන්තුවක් ලබා ගනු ලබන අතර, එම තක්සේරුව දළ ඇස්තමේන්තුවක් පමණක් වන අතර, නිශ්චිත තක්සේරුව ලබා දෙනු ලබන්නේ අත්කර ගැනීමේ 7 වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ දිනටය. ඒ අනුව තක්සේරුව වෙනස් වීමේ හැකියාවක් පවතී, මේ පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විමසීම සුදුසු බව නිරීක්ෂණය කරමි.	දළ ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව ලබාගත යුතුය.
(ඇ)	ගම්පහ දිස්ත්‍රික්කයේ වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශය තුළ පුද්ගලයකු සතු අක්කර 01 රූඩ් 01 පර්චස් 17.25 ක ඉඩම අත්පත් කර ගැනීමේ විධානය යටතේ තක්සේරු වටිනාකම රු.මිලියනයක් වූ ඉඩම අත්පත් කරගන්නා අවස්ථාව වන විට එහි වටිනාකම රු.මිලියන 153.93 ක් වී තිබුණි.	පනත අනුව අත්කර ගැනීමේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීමේදී යෝජිත ඉඩමේ දළ ඇස්තමේන්තුවක් ලබා ගනු ලබන අතර, එම තක්සේරුව දළ ඇස්තමේන්තුවක් පමණක් වන අතර, නිශ්චිත තක්සේරුව ලබා දෙනු ලබන්නේ අත්කර ගැනීමේ 7 වගන්තිය යටතේ ගැසට් පත්‍රයේ දිනටය. ඒ අනුව තක්සේරුව වෙනස් වීමේ හැකියාවක් පවතී, මේ පිළිබඳව වැඩිදුර තොරතුරු සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව විමසීම සුදුසු බව නිරීක්ෂණය කරමි.	දළ ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව ලබාගත යුතුය.
(ඉ)	ඉඩම් අත්පත් කර ගැනීමේ පනතෙහි 38 වන වගන්තිය යටතේ ආඥාවක් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට වන්දි මුදලට අමතරව පොලියක්ද ගෙවීමට සිදුවන අතර විගණනය විසින් නියදි ලෙස තෝරාගත් අවස්ථාවන් 03 කදී 17 වගන්තිය අනුව ප්‍රදානය කළ මුදල රු.මිලියන 202.31 ක් වූ අතර ඒ සඳහා ගෙවා ඇති සහ ගෙවිය යුතු පොලිය රු.මිලියන 188.54 ක් වී තිබුණි.	ඉඩම් අත්කර ගැනීමේ පනතේ නියෝග 261(4) අනුව 38(අ) අතුරු විධානය යටතේ පවරා ගැනීමක් සිදු කල විට, එසේ පවරා ගත් දින සිට වන්දි ගෙවනු ලබන දින දක්වා පොලී මුදල් ගෙවීම සිදු කළ යුතුය.	ඉඩම් අත්පත් කරගැනීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කර අමතරව පොලී වියදම අඩුකර ගත යුතුය.

(ඊ)	ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වසර 05 ක කාලයක් තුලදී ලැබුණු ප්‍රතිපාදනය රු.මිලියන 21,212.23 ක් වුවද ඉන් නිදහස් කල මුදල රු.මිලියන 13,448.43 ක් වී තිබුණි. එම වටිනාකමෙහි පොලිය සහ වන්දි කොපමණද යන්න වෙන වෙනම හදුනාගත හැකි පරිදි ලේඛන පැවැත්වීමක් හෝ ගණනය කිරීමක් කර නොතිබුණු අතර විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව 2023 හා 2024 වර්ෂ දෙක තුලදී පමණක් වන්දි ලෙස රු.මිලියන 3,640.27 ක් හා පොළිය ලෙස රු.මිලියන 1765.96 ක් අදාල කටයුත්ත සඳහා වැය කර තිබිණි. ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත නිදහස් කරන ලද ප්‍රතිපාදන වලින් සත්‍ය වශයෙන් ගෙවීම් කරන ලද්දේ කුමන ඉඩම සම්බන්ධවද යන්න සැසඳීමක් සිදුකිරීම සඳහා ගෙවීම් සම්බන්ධ සාරාංශ වාර්තාවක් ලබාගන සැසඳීම් සිදුකර නොතිබුණි.	ඉඩම් අත්කර ගැනීම් සඳහා ගෙවූ වන්දි හා පොලී ගෙවීම් වලට අදාළ තොරතුරු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වශයෙන් හා ඉඩම් අත්පත් ගොණු අංක වශයෙන් වෙන් කරන ලද ලෙජර් ගොණු වල සටහන් කරනු ලබන බැවින්, වැඩිදුර අධ්‍යයනය සඳහා එම ලෙජර් ඔබ වෙත ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.	ඉඩම් අත්පත් කරගැනීම් සඳහා නිදහස්කරන ප්‍රතිපාදන පිළිබඳ සැසඳීමක් සිදු කළ යුතුය.

5. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.	මෙම පුරප්පාඩු සම්බන්ධයෙන් සුදුසු නිලධාරීන් අනුයුක්ත කරන ලෙස ඉල්ලා රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් සිදු කර ඇත.	වර්තමාන කාර්ය භාරය සමාලෝචනය කර පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය.

	අනුමත සංඛ්‍යාව	**තත්‍ය සංඛ්‍යාව**	**පුරප්පාඩු සංඛ්‍යාව**
	-----	----	-----
ජ්‍යෙෂ්ඨ	29	25	04
තෘතීයික	05	02	03
ද්විතියික	549	516	33
ප්‍රාථමික	44	37	06
වෙනත්	02	-	-
එකතුව	**629**	**580**	**46**

අනුමත ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 04 ක්ද, තෘතියික මට්ටමේ තනතුරු 03 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 33 ක්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක්ද කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතියද වර්තමානයේදී ඉටුකිරීමට පවතින හා සැලසුම් කරන කාර්යභාරය සමාලෝචනයක් සිදුකර ඒ අනුව තනතුරු සඳහා අනුමැතිය ලබා ගෙන බඳවාගැනීමට කටයුතු කර නොතිබුණි.